# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ඇප (සංශෝධන)

**1997 අංක 30 දරන ඇප පනත සංශෝධනය කිරීම පිණිස වූ**
**පනත් කෙටුම්පතකි**

---

අධිකරණ අමාත්‍යතුමා විසින් 2020 නොවැම්බර් මස 26 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2020 නොවැම්බර් මස 03 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[15 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් 1997 අංක 30 දරන ඇප පනතේ 6, 12 සහ 18 යන වගන්ති සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තිවල නීතිය බලපෑම වනුයේ එම වගන්තිවල නිශ්චිතව දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් පනවා ඇති දඩ මුදල් වැඩි කිරීම වේ.

එල්.ඩී.—ඕ. 49/2019

## 1997 අංක 30 දරන ඇප පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2020 අංක  දරන ඇප (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති 1997 අංක 30 දරන පනතේ ඇතැම් වගන්ති සංශෝධනය කිරීම.*

**2.** මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති 1997 අංක 30 දරන ඇප පනතේ වගන්ති, එම වගන්තිවල නිශ්චිතව දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් පනවා ඇති දඩ මුදල් වැඩි කිරීමේ කාර්යය සඳහා එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන වෙනුවට III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

### උපලේඛනය

(2 වන වගන්තිය)

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *සංශෝධනය කරනු ලබන වගන්ති* | *ඉවත් කිරීම* | *ඇතුළත් කිරීම* |
| 6(2) | රුපියල් දහසකට | රුපියල් පහළොස් දහසකට |
| 12(2) | රුපියල් සියයකට | රුපියල් දස දහසකට |
| 18(5) | රුපියල් එක්දහස් පන්සියයකට | රුපියල් විසි පන්දහසකට |